**8 වන පිටෙන්**

උත්සාහ කරන්නේ ඒකීයභාවය ආරක්ෂා කිරීමටයි. දුටුගැමුණු රජතුමාගේ කාලයේ සිටම ශ්‍රී ලංකාව ඒකීය රාජ්‍යයක්. ශ්‍රී ලංකාද්වීපයම එක් රටක් ලෙස කටයුතු කළා. එහි බලය රජතුමා යටතේ පැවතුණා. එදා අතීතයේ සිට අද දක්වාම ශ්‍රී ලංකාව ලෙස හඳුන්වන්නේ එකම භූමියකටයි.

දකුණු ඉන්දියාව දුර්වල වූ අවස්ථාවකදී එහි කොටසක් අල්ලා ගැනීමට හෝ මාලදිවයිනේ කොටසක් අල්ලා ගැනීමට හෝ රජ දවසේ සිට මේ දක්වා අප කටයුතු නොකළේ අප ඒකීය රාජ්‍යයක් නිසයි. එදා සිට අද දක්වාම ශ්‍රී ලංකා භූමියත් ඊට අයත් දූපත් කිහිපයක් ඒකීය රාජ්‍යයක් ලෙස පැවතුණා.

අවුරුදු දහස් ගණනක ඉතිහාසය පුරාම මහාවංශයෙත් සඳහන් වන ආකාරයට අපි ඒකීය රාජ්‍යයක් ලෙස පැවත එනවා. එදා සිට වෙනත් රටවල් ආක්‍රමණය කිරීමට හෝ වෙනත් රටක කොටසක් අපේ රටේ කොටසක් ලෙස නම් කිරීම හෝ අපි සිදු කර නැහැ.

ඒ වගේම ශ්‍රී ලංකාවට අයිති මේ භූමි ප්‍රමාණය බෙදා වෙන් කිරීමට අපි ඉඩ දෙන්නේත් නැහැ. එසේ නම් ශ්‍රී ලංකාව මීටත් වඩා ප්‍රමාණයෙන් විශාල කිරීමටත් මේ භඛ්ඩම් ප්‍රමාණය බෙදා වෙන් කරමින් අඩු කිරීමටත් අප කටයුතු කරන්නේ නැහැ. ඊට ඉඩ ලබා දෙන්නේත් නැහැ.

රටේ ඒකීය භාවය දියාරු කිරීමට අපට කිසිදු වුවමනාවක් නැහැ. 1815 දී බ්‍රිතාන්‍ය ජාතිකයින් මේ රටේ බලය ලබා ගැනීමෙන් පසුව 1948 දී එනම් මීට වසර 70 ට පෙර අපට නැවත නිදහස ලබාගැනීමට හැකියාව ලැබුණා.

නිදහස ලබා ගැනීමෙන් පසුව නැවත රජතුමා යටතේ පාලනය වන ක්‍රමයක් රටට ගැලපුණේ නැහැ. රජවරු පත් කිරීමට මේ රටේ ජනතාව අකමැති වුණා. රට පාලනය කිරීමේ බලය හිමි වූයේ පාර්ලිමේන්තුවට සහ ජනතාවටයි. එය හඳුන්වන්නේ ස්වෛරී භාවය ලෙසයි. ස්වෛරී භාවයේ කේන්ද්‍රස්ථානය පාර්ලිමේන්තුව සහ මහජනතාවයි.

ශ්‍රී ලංකාව නම් භූමි භාගයෙහි ජීවත් වන සියලු දෙනා මේ රටේ මහජනතාවයි. මේ රට අයිති වන්නේ රටේ  මහජනතාවටයි. අපට අයිති මේ රටේ ඒකීය භාවය දියාරු කිරීමට අප ඉඩදෙන්නේ නැහැ. 1972 ජන රජයක් බවට පත්වෙමින් ණීඒකීය රාජ්‍යණී යන වචනය අපි ව්‍යවස්ථාවට ඇතුල් කළා. 1978 ව්‍යවස්ථාවටත් එය ඇතුළත් කළා. 13 වන සංශෝධනයේදීත් එය වෙනස් කළේ නැහැ. එසේ නම් ණීඒකීය රාජ්‍යණී සංකල්පය අප විනාශ කරන්නේ නැහැ. යෝජිත නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත තුළත් ඒකීය රාජ්‍ය යන සංකල්පය කිසිදු වෙනසකින් තොරව ඇතුළත් කර තිබෙනවා.

1972 ඉංග්‍රීසි ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ ණී ඔබසඒරහ රාජ්‍යය ලෙසයි. ඉන් අදහස් වන්නේ ණීඒකීයණී යන අර්ථය නොවේ. මෙය ණීඒකීය රාජ්‍යණී සංකල්පය තරම් පැරැණි සංකල්පයක් ද නොවෙයි. 18 වන ශතවර්ෂයේ නවීන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සැකසෙන කාලයේ මෙම සංකල්පය ඉදිරිපත් කළේ මහා බ්‍රිතාන්‍ය විසිනුයි. එංගලන්තය, ස්කොට්ලන්ත සහ වේල්සය එකතු කරගනිමින් මහා බ්‍රිතාන්‍යය නිර්මාණය වුණා. රට පාලනය කිරීමේ බලය හිමි



රටේ ඒකීය භාවය දියාරු කිරීමට අපට කිසිදු වුවමනාවක් නැහැ. 1815 දී බ්‍රිතාන්‍ය ජාතිකයින් මේ රටේ බලය ලබා ගැනීමෙන් පසුව 1948 දී එනම් මීට වසර 70 ට පෙර අපට නැවත නිදහස ලබාගැනීමට හැකියාව ලැබුණා.

වන්නේ පාර්ලිමේන්තුවට බව එහිදී ඔවුන් ප්‍රකාශ කළා. එදා මහා බ්‍රිතාන්‍ය ස්වෛරී භාවය පාර්ලිමේන්තුව තුළ මධ්‍යගත කළේ ඒ ආකාරයටයි. එය ජනතාවට පමණක් හිමි වූයේ නැහැ. එය පාර්ලිමේන්තුවේ මධ්‍යගත කළේ ඒ නිසයි.

මහා බ්‍රිතාන්‍ය තුළ රාජ්‍යයක් ඇති කරමින් එහි ස්වෛරී බලය ඒ ආකාරයට පාර්ලිමේන්තුවට ලබාදුන්නා . එය හඳුන්වන්නේ ණී ඔබසඒරහ සංකල්පයණී ලෙසයි. ඉන් පසුව බලය බෙදා වෙන් කිරීමේ ක්‍රමය වූ ණීෆෙඩරල් සංකල්පයණී ඇමරිකාව විසින් ගෙන ආවා. මෙම ණීඔබසඒරහය සහ ණීෆෙඩරල්ණී සංකල්පයට අනුවයි නවීන රටවල් ගණනාවක් වර්ථමානයේ පාලන කටයුතු සිදු කරන්නේ.

කෙසේ වුවත් බ්‍රිතාන්‍යයේ ණී ඔබසඒරහ සංකල්පයණී තුළ අපේ රටේ වැනි බලය බෙදාහැරීමක් දක්නට නැහැ. ශ්‍රී ලංකාව ඒකීය රටක් බැවින් 13 වන සංශෝධනය සිදු කිරීමට හැකි වුණා.

Unitay සංකල්පය යටතේ බලය බෙදාහැරීමට හැකි දැයි ඇතැමුන් අධිකරණයෙන් ප්‍රශ්න කළා. එවිට ශ්‍රේෂ්ඨාධිකරණයේ බහුතරයක් පැවසුවේ රටේ ඒකීය භාවයට හානියක් නොවනවා නම් එහි ස්වෛරීභාවයට බලපෑමක් නොවනවා නම් බලය බෙදිය හැකි බවයි. පළාත් සභා ක්‍රමය ඇති කළේ ඒ අනුවයි.

පසු කාලයේදී එංගලන්තයත් ස්කොට්ලන්තයට බලය ලබා දුන්නා. ස්කොට්ලන්ත සභාවක් ඇති කරමින් අපි පළාත් සභා වලට බලය ලබාදුන් ආකාරයට ස්කොට්ලන්තයට පාලන බලය ලබා දුන්නා. නමුත් මහා බ්‍රිතාන්‍යය ඉන් නැවතුණේ නැහැ. ස්කොට්ලන්තයට ජනමත විචාරණයකින් තනි රාජ්‍යයක් වීමට අවශ්‍ය නම් තමන් ඊට ඉඩ ලබාදෙන බව 2012 වර්ෂයේදී එංගලන්තය පැවසුවා.

Unitary සංකල්පය තුළ මෙතෙක් කල් එවැනි ක්‍රමයක් පැවතුණේ නැහැ. ඔවුන් 2015 දී ස්කොට්ලන්තය තනි රාජ්‍යයක් විය යුතු ද නැද්ද යන්න පිළිබඳව ජනමත විචාරණයක් පැවැත්වුවා. බහුතරයක් එහිදී පැවසුවේ තනි රාජ්‍යයක් බවට පත්වීමට අවශ්‍ය නැති බවයි. නමුත් අනාගතයේදී ඔවුන්ට අවශ්‍ය නම් මහා බ්‍රිතාන්‍යයෙන් වෙන් වී තනි රාජ්‍යයක් බවට පත්වීමට හැකියාව තිබෙනවා.

ඒ අනුව එම ක්‍රියාවලියේදී ඒකීය සංකල්පය දියාරු කිරීමක් සිදුව නැහැ. අපේ රටේ ගැටලුව වන්නේත් Unitary යන වචනය හරහා ඒකීය භාවය දියාරු කිරීමක් සිදු කරනවාද නැද්ද යන්නයි. පසුගිය වසරේ අගභාගයේදී මම ඩයස්පෝරා ක්‍රියාකාරීන් මුණගැසුණු අවස්ථාවේදී ඔවුන් පැවසුවේ, ඒකීය භාවය සංකල්පයට ඔවුන්ගේ විරුද්ධත්වයක් නොමැති බවයි. අවශ්‍ය ඕනෑම අවස්ථාවක ජනමත විචාරණයකට යාමට අවස්ථාව තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මෙහෙයුම් කමිටුව එම වාර්තාව සකසන විට ඒකීය යන වචනය සම්බන්ධයෙන් ගැටළුවක් ඇති වුණේ නැහැ. එයට සියලූ දෙනාම එකඟවුණා.

නමුත් Unitary යන වචනයෙන් ඒකීය භාවය දියාරු කිරීමක් සිදු වනවා ද නැද්ද යන්න පිළිබඳව මත දෙකක් ඇතිවී තිබුණා. Unitary යන වචනය ව්‍යවස්ථාවේ ඒකීය යන වචනයට නොගැලපෙන බව ඇතැමුන් ප්‍රකාශ කළා. ඇතැමුන් ඊට විරුද්ධ වුණා. ඒ පිළිබඳ අනාගතයේදී  සාකච්ඡා කිරීමට හැකියාව ලැබේවි.

එම නිසා අපේ ව්‍යවස්ථාවට ණීඒකීය රාජ්‍යණී යන වචනය කිසිදු ගැටළුවකින් තොරව ඇතුළත් කර තිබෙනවා. නමුත් Unitary යන වචනය රටේ ඒකීය භාවය දියාරු කිරීමක් කරනවා ද නැද්ද යන්න පිළිබඳව ඉදිරියේදී රට තුළ සාකච්ඡා කිරීමට හැකියි.

එම නිසා ඒකීය රාජ්‍ය යන සංකල්පය මේ වනවිටත් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කර තිබෙන අතරම මේ සම්බන්ධ විවාදය ආරම්භ වූ පසු Unitary සංකල්පය තුළ රටේ බෙදීමක් ඇති කරනවා ද නැද්ද යන්න පිළිබඳව සාකච්ඡා කළ හැකියි.

අපට රටේ ඒකීය භාවය කිසි ලෙසකින්වත් දියාරු කිරීමට නොහැකියි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් වන යම් කිසි වචනයක් හේතුවෙන් රටේ ඒකීය භාවය දියාරු වෙනවා නම් එය ඉවත් කළ යුතුයි. එසේ සිදු නොවනවා නම් ගැටළුවක් නැහැ. ඒ පිළිබඳව පක්ෂ අතර සාකච්ඡා කරමින් එකඟත්වයකට පැමිණිය යුතුයි.

## ද්‍රවිඩ සන්ධානයේ ස්ථාවරය

ණීඔබසඒරහය යන වචනය පිළිබඳව ව්‍යවස්ථාදායක සභාවේදී වාද කිරීමට අපට හැකියාව තිබෙනවා. ණීඒකීයණී වචනය ඇතුළත් වී තිබෙන බව ද්‍රවිඩ සන්ධානය දුටු විට ඔවුන් සිය පැරැණි ස්ථාවරය පසුපසට ගනිමින් ප්‍රධාන පක්ෂ දෙක මෙම මූලික ප්‍රතිපත්තිවලට එකඟ වෙනවා නම් රටේ ස්ථාවර භාවයක් ඇති කිරීම සඳහා අපත් මේ පිළිබඳව සලකා බලන බව ඔවුන් ප්‍රකාශ කළා.

සලකා බැලීම යනුවෙන් ඔවුන් අදහස් කරන්නේ කුමක්ද? පළමු කාරණය ඒකීය රාජ්‍ය සංකල්පය. දෙවන කාරණය ඒකීය රාජ්‍ය සංකල්පය තුළ උපරිම බලය බෙදා හැරීම, කිසිවෙකුටත් මදි පුංචි කමක් සිදු නොවන සේ මූලික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම තුන්වන කාරණයයි. හතරවන කාරණය නම් පාර්ලිමේන්තුවට අමතරව තවත් සෙනට් සභාවක් ඇති කිරීම සහ පස්වන කාරණය ශක්තිමත් අධිකරණයක් පිහිටුවීම ඔවුන් ඉල්ලා සිටින්නේ. මෙම කාරණා 05 යි.

ඔවුන් ඒකීය භාවණී සංකල්පය පිළිබඳව සලකා බැලීමට කැමැත්ත ප්‍රකාශ කර තිබෙනවා. මේ අවස්ථාව පිළිබඳව අප රටට පැවසිය යුතුයි.

ව්‍යවස්ථාවේ ඇතුළත් වචන පිළිබඳව අප එකඟත්වයක් ඇති කර ගත යුතුයි. කෙසේ වුවත් ඒකීය භාවය සංකල්පයට පිළිබඳව දෙමළ සන්ධානයේ පවා ගැටළුවක් නැහැ. Unitary යන වචනය රටේ ඒකීය භාවය දියාරු කිරීමක් කරනවාද නැද්ද යන්න පිළිබඳව මේ සම්බන්ධ ඉදිරි පියවරයන්හිදී විවාදයට ගැනීමට හැකියි.

එසේ නම් වසර 50 ක් 60 ක් තුළ මේ රට වෙනුවෙන් කිරීමට නොහැකි වූ විශාල වැඩකොටසක් දැන් අප සිදු කර තිබෙනවා. ඒකීය භාවය ආරක්ෂා කරගනිමින් අප ඉදිරියට යනවා නම් මීළඟ මැතිවරණයට පෙර රටට ගැලපෙන ඉතා හොඳ ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීමට හැකි වෙනවා.

ඔබව හමුවීමට අද මෙම ස්ථානයට පැමිණි නිසා මේ පිළිබඳව ඔබව දැනුම්වත් කිරීමට මම කල්පනා කළා. ඔබ සියලූ දෙනා මාර්ගයෙන් මෙය ගමට රැගෙන යා යුතුයි. ජාතිවාදය, ආගම්වාදය රට තුළ ඇති කිරීමට කිසිවෙකුටත් ඉඩ දෙන්න එපා. අප ගෙන එන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ජාතිවාදී හෝ ආගම්වාදී නොවෙයි.

මෙහි වෙනත් කරුණු පිළිබඳව කතා කිරීමට නොහැකි වූ විට ඇතැම් පුද්ගලයින් ජාතිවාදය හා ආගම්වාදය පිළිබඳව කතා කරමින් ගැටළු ඇති කිරීමට උත්සාහ දරනවා. අප ඊට ඉඩ නොදී අපේ වැඩසටහන ඉදිරියට ගෙන යා යුතුයි.

colombo Telegraph